ගොවි ගෙදර





# ජානකීගේ පලා මල්ල

**ගෙවත්තේ සාර්ථක ගොටුකොළ වගාවක් පවත්වාගෙන යන ආකාරය පිළිබඳ කතාබහේදී අප පසුගිය සතියේ ඔබ දැනුවත් කළේ වගාව සඳහා සුදුසු ස්ථානයක් තෝරා ගෙන පාත්තිය සකස් කිරීම පිළිබඳයි...**



ගොටුකොළ වගාවකදී පාත්තිය සැකසීමත් ඉතා වැදගත් නිසා ඒ ගැන තිසි දැනුමත් ඉතා වටිනවා.

පාත්තිය වටේ කණ්ඩිය (ගැට්ට) සෑදීමට මතුපිට පස් තට්ටුව භාවිත නොකරන්න මතක තබාගන්න.

වගාවට අවශ්‍ය ස්වභාවික පොහොරින් යුත් හියුමස් පස් තට්ටුව වන්නේ මතුපිට ඇති පස් තට්ටුවයි. ශාකයට අවශ්‍ය පොහොර ලබාදීමට උපකාරී වන ක්ෂුද්‍ර ජීවීන් ජීවත්වන්නේ මතුපිට පස් තට්ටුව තුළ නිසා ඔවුන්ට ඔක්සිජන් පහසුවෙන් ලබාගත හැකිවේ.

## පස් මිශ්‍රණය

මතුපිට පස් ප්‍රමාණයට කොම්පෝස්ට් ගොම පොහොර ටිකක් එකතුකර පාත්තියට දමා තුනී කරන්න මතක තබා ගන්න.

පාත්තියේ මතුපිට කළු පැහැ පස් ඇතිවිට කොම්පෝස්ට් ගොම අඩුවෙන් එකතු කිරීම සෑහේ.

කළු පසක් නැතිව රතු පසක් ඇතිවිට කොම්පෝස්ට් ගොම වැඩියෙන් එකතු කරන්න.

## වගාවට සුදුසු ගොටුකොළ

පාත්තියේ සිටුවිය යුත්තේ ගොටුකොළයෙහි මුල් කොටසය. ගොටුකොළවල මුල්වලින් අඟලක් උඩින් කොළ කඩා මුල් සිටුවීමට තෝරා ගන්න.

සිහින් පත්‍ර හා දණ්ඩ සහිත ඕනෑම ගොටුකොළ වර්ගයක් තෝරා ගන්න.

තිබේ නම්, ගම්වල ඇති ඖෂධ ගුණයෙන් යුත් හීන් ගොටුකොළ තෝරා ගන්න.

## බඳුන්වල සිටුවීම

ඔබේ ගෙවත්තේ පාත්තියක් සෑදීමට ඉඩ නැතිනම් මල් බඳුනක, ප්ලාස්ටික් බඳුනක, හාල් බෑගයක පස් මිශ්‍රණයක් සාද එහිද වගාකළ හැකිය.

## පාත්තිවල සිටුවීම

පාත්තියේ අඟලක පරතරයක් සිටින සේ මුල සහිත ගොටුකොළ සිටුවා ගන්න. මල් බාල්දියකින් හෝ බඳුනකට අත තබා හෝ පාත්තියට ජලය වත්කර හිරුඑළිය තදින් නොවැටෙන සේ ඇල්බීසියා වැනි අතු පස් කණ්ඩිය මත සිටුවා පාත්තිය ආවරණය කරන්න. දින 3 කදී ආවරණයට සිටවූ අතුවල පත්‍ර සියල්ල සූරා පාත්තියට දමන්න. මෙමගින් ගොටුකොළවල පෝෂණයට පසට වැඩිපුර නයිට්‍රජන් ප්‍රමාණයක් ද එක් වේ.

සතියක් තුළදී දලු ලියලීම ආරම්භ වන නිසා දිනපතා ජලය යොදන්න. දින 10 – 12 ට පසු කොම්පෝස්ට්, ගොම පොහොර පැළ අතරින් යොදන්න.

දින 30 කදී ගොටුකොළ ආහාරයට ගත හැකි ප්‍රමාණයට වැඩී ඇත. මුල්වලින් උදුරා නොගෙන මුල්වලින් පැළ වැවීමට ඉඩ දෙන්න.

සති දෙකෙන් දෙකට කොම්පෝස්ට් හා දියර පොහොර දමන්න. දියර පොහොර සාදන ආකාරය ඉදිරියේ දී කතාබහ කරමු.

සැම විටකම ගොටුකොළ වගාව අතගා එයට හදවතින්ම ආදරය කරන්න.





* අද කෑමට ගෙවත්තේ ගොටුකොළ සම්බෝලයකුත් තියෙනවා.... මේ ගෘහණියකගේ ආඩම්බරයයි

# "දින තුනක් ආවරණය කර තබන්න"

ශාකවලට ප්‍රාණවත් බවක් ලැබෙනවා සේම යහපත් සිතුවිලි ගුණවගාව සරුසාරු අස්වැන්නක් ලබාදෙන බව තිරන්තරුවම විශ්වාස කරන්න.

තුරුලතා සමග ඔබගේ ඇති සදදරණීය බැඳීම ඇති කරන පරිසරයේ රහස කාබනික වගා ක්‍රමයයි.

කාබනික ගෙවත්තක අස්වනු නෙලීමේ අසිරිය විඳ ගැනීමට සතිපතාම අප සමග රැඳී සිටින්න.

**අදීෂා විතිනානි ගුණරත්න**

**පලා වවමු - තෑගි දිනමු**

නම :-..............................

ලිපිනය :-..............................

..............................

..............................

දුරකතන අංකය :-..............................

අත්සන :-..............................

**මේ සතියේ ප්‍රශ්නය -**
**පලා වගාවේදී පොළව මතුපිට පස් තට්ටුව ආරක්ෂා කරගත යුත්තේ ඇයි?**
**ඔබේ පිළිතුරු (තැපැල් පත් මගින්)**
**පලා වවමු තෑගි දිනමු**
**තරුණී**
**ලේක්හවුස්**
**කොළඹ 10.**

**සතිපතා කූපත් ඇදීමෙන් තෝරා ගන්නා ජයග්‍රාහකයන් 3 දෙනකුට ඕනෑම Keels Super වෙළෙඳ සැලකින් රු. 1000 බැගින් වූ තෑගි වවුචර 3 ක් හා ත්‍රී ස්ටාර් පලා ඇසුරුම සහිත තිළිණයක් පිරිනැමේ.**

උපදෙස් -
**ජානකී කත්‍රිආරච්චි**

# අපේ කොඩියට මං ආදරෙයි

## ලෝක ළමා දිනය නිමිත්තෙන් අගනා පොත් තිළිණයක්...

**තරුණී ලෝක ළමා දින තිළිණය**

දරුවාගේ නම :-..............................

වයස :-..............................

ලිපිනය :-..............................

..............................

දුරකතන අංකය :-..............................

**ගුණ නැණ පිරි අනාගත පරපුරක් වෙනුවෙන් ළමයින් වෙත හොඳම දේ රැගෙන යන්නට නිති වෙහෙසෙන තරුණී වෙතින් මෙවර ලෝක ළමා දිනයට අගනා ළමා පොතක පිටපත් 2000 ක් තිළිණ වේ.**

"අපේ කොඩියට මං ආදරෙයි" නම් මේ ළමා කතා පොත මහගු ජාතික මෙහෙවරක් උදෙසා ජනප්‍රිය ළමා ලේඛිකා සමන්මලී පද්මකුමාර විසින් රචනා කරනු ලැබූවකි.

ජාතික කොඩිය පිළිබඳ අභිමානයෙන් සිතීමට කුඩා දරු දැරියන් පෙළඹවීම වැඩිහිටි අපේ යුතුකමයි. මේ ළමා කෘතියේ ද වර්ණවත් සිතුවම් පෙළක් සමඟ හරබර දැනුමක් සරල බසට කැටිවන්නේ ඒ යුතුකම වෙනුවෙනි.

කූසපත් ඇදීමෙන් තෝරාගන්නා ඔබේ දූ පුතුන්ට මේ අගනා තිළිණය හිමිවන අතර ඒ සඳහා පහත කූපනය සම්පූර්ණ කර අප වෙත එවන්න.

**ලෝක ළමා දින තිළිණය,**
**තරුණී,**
**ලේක්හවුස්,**
**කොළඹ 10.**

